# ශූන්‍යතාවය
# හා
# නිවන

දන්කන්දේ ධම්මරතන හිමි

2550
2006

# පෙරවදන

ශූන්‍යතාවය ගැන ලියැවුණු මෙම පොත කුඩා වුවත්, එහි දැක්වෙන කරුණු පාරමී ශක්තියක් ඇති කෙනකුට මේ ජීවිතයේදී ම නිවන් අවබෝධ කර ගැනීමට හේතු වනු ඇත. එසේ වන්නේ මෙම පොත නවකථාවක් කියවාගෙන යන්නා සේ කියැවීමෙන් නො වේ. එහි දැක්වෙන කරුණු තමාට ම ප්‍රත්‍යක්ෂ ලෙස අවබෝධ වෙමින්, ඒවා තම ගැඹුරු සිතට පෙනී යමින් කියැවීම අත්‍යවශ්‍ය වේ. උදාහරණයකට, "ඇසට පෙනෙන රූප යනු සිත තුළ නාම ධර්ම ටිකක් ඇතිවී නැතිවී යාම පමණක්යැ"යි දැක්වෙන කොටසක් කියවන විට, "බලනවා" කියන්නේ සිත තුළ නාම ධර්මයන්ගේ ඇති වී නැති වී යාම පමණක් ම නේද යන කරුණ තමාට ම ප්‍රත්‍යක්ෂ ලෙස අවබෝධ වී ඒ බව සිතට පෙනී යා යුතුය. ඒ ආකාරයෙන්, ප්‍රත්‍යක්ෂ අවබෝධයක් ඇති කර ගනිමින් මේ පොත කියවා, එහි දැක්වෙන කරුණු සිතින් අත්දකින්න බලන්න.

මෙම පොත ධර්ම දානයක් ලෙස බෙදා හැරීම සඳහා, එංගලන්තයේ සෙල්ස්ඩන් නගරයේ තේම්ස් බෞද්ධ විහාරයේ ශීල-භාවනාවන්හි යෙදෙන වෛද්‍ය අයෝමී කාරියවසම් මහත්මිය ඇතුළු පිරිස විසින් ස්ටර්ලිං පවුම් 70 (රු. 14,000/-) ක් පරිත්‍යාග කරන ලදි. ඒ සැම දෙනාට ම නිවන් සුවම අත්වේවා'යි පතමු.

මෙහි ටයිප් සෙටිං කර දුන් රත්මලානේ පදිංචි ලුශාන්ති නිල්මිණි ලියනගේ මහත්මියටත්, මෙය මැනවින් මුද්‍රණය කර දුන් ඩයෝර්ග් මුද්‍රණාලයේ අධිපති මහතාට සහ විශේෂයෙන් ම සසංක ලියනගේ මහතා ඇතුළු එහි සේවක පිරිසටත් නිවන් සුව ම අත්වේවා !

දන්කන්දේ ධම්මරතන හිමි
"දහම් අසපුව"
236/19, මොරටුහේන පාර,
අතුරුගිරිය.
දුරකථනය : 0602140837
2006-12-05

# ශූන්‍යතාවය හා නිවන

සෑම බෞද්ධයකු ම බලාපොරොත්තු වන්නේ නිවන් සුව ලබා ගැනීමට යි. නිවන් සුව ලබා ගැනීමට උපකාර වන ශූන්‍යතාවය ගැන සරල ධර්ම කරුණු ටිකකුයි, අප අද ඉදිරිපත් කරන්නේ. මෙහි කියන කරුණු ප්‍රත්‍යක්ෂ ලෙස හදවතින් තමාට ම අවබෝධ වී, සමාධි-ප්‍රඥා තුළින් ශූන්‍යතාවයකට සිත පත් කර ගන්නට හැකි වුවහොත්, එම ශූන්‍යතාවය ඉක්මවා ගොස්, එය නිවී ගිය නිවනට සිත පත් කර ගන්නට හැකිකම සමහර විට සමහර කෙනකුට තිබිය හැකි බැවින්, ඔබත් මෙය ඉතා හොඳින් අවබෝධ කර ගන්න බලන්න; භාවනා කර බලන්න.

**ශූන්‍යතාවය යනු කුමක්ද ?**

"ශූන්‍යතාවය" කියන එකේ සරල සිංහල අදහස, "හිස් භාවය" කියන එකයි. ඒ කියන්නේ, මොකක්වත් නැතිනම් එතැනට අපි කියන්නෙ, "හිස්" කියල, ශූන්‍යයි කියල. බුදුරජාණන් වහන්සේ කියන්නේ, "සුඤ්ඤත" කියලා. බුදුරජාණන් වහන්සේ "**සුඤ්ඤතෝ ලෝකං අවෙක්කස්සු මෝඝරාජ සදාසතෝ**" කියල පරායන වර්ගයේ, "මෝඝරාජ සූත්‍රයේ" දක්වල තියෙනවා. උන්වහන්සේ "මෝඝරාජ" කියන බ්‍රාහ්මණයා අමතා කියනවා, "මේ ලෝකයම ශූන්‍යයි, ශූන්‍ය වශයෙන් දකින්න" කියලා. තවත් තැනකදී බුදුරජාණන් වහන්සේ "චූල සුඤ්ඤත", "මහා සුඤ්ඤත" කියන සූත්‍ර දෙකක් ම, මේ ශූන්‍යතාවය අරමුණු කරගෙන දේශනා කර තියෙනව. මජ්ඣිම නිකායේ ඒ සූත්‍ර දෙකම තියෙනව. මජ්ඣිම නිකායේ ම තවත් සූත්‍රයක් තියෙනවා, "පිණ්ඩපාත පාරිශුද්ධි සූත්‍රය" කියල. එම සූත්‍රයේ දක්වා තිබෙනවා, සැරියුත් හාමුදුරවෝ බුදුරජාණන් වහන්සේ දකින්නට ආවට පස්සේ, සැරියුත් හාමුදුරුවන් වහන්සේගේ මුහුණ හරිම ප්‍රසන්නයි, හරිම පැහැදිලියි. ඉතින් බුදු රජාණන් වහන්සේ ඇසුවා, මොකද ඔබගේ මුහුණ ඉතාම ප්‍රසන්න, ඉතාම පැහැදිලි කියලා.

"බුදුරජාණන් වහන්ස, මම සුඤ්ඤත විහරණයෙන් වාසය කළා." කියල, සැරියුත්

හාමුදුරුවෝ පිළිතුරු දුන්නා. බුදු රජාණන් වහන්සේත් ඒක අනුමත කළා. මේ සුඤ්ඤත විහරණයට "මහා පුරිස විහරණය" කියා මා කියනවා" කියල, පිණ්ඩපාත පාරිශුද්ධ සූත්‍රයේ දක්වල තියෙනව. මේ විධියට බුදුරජාණන් වහන්සේ විවිධ තැන්වල ශූන්‍යතාවය පිළිබඳව, දේශනා කර තිබෙනවා. මා පළමුවෙන් මේ කරුණු කීවේ, සමහර අය කියනවා, ශූන්‍යතාවය කියල එකක් බුදුරජාණන් වහන්සේ දේශනා කරල නැහැ කියල. ඒ කථාව වැරදියි කියල පෙන්නුම් කරන්නයි, අප සූත්‍ර පිටකයේ විවිධ තැන්වල තිබෙන කරුණු කිහිපයක් ඉදිරිපත් කළේ.

**ශූන්‍යතාවය කියන්නෙ, කිසිවක් නැති හිස් භාවයද ?**

ශූන්‍යතාවය කියන්නේ, මොකක්වත් නැති හිස් භාවය කියන අර්ථයම නොවෙයි. අපට කලින් යමක් දිස් වෙනවා "තිබෙනවා" කියල. නමුත් ඒක සත්‍යයක් වශයෙන්, විශ්ලේෂණය කරල නැත්නම් නුවණින් විමසල බලන විට, එහි කිසිවක් නැතුව හිස්වී යන ස්වරූපයක් තියෙනවා නම්, අන්න ඒකටයි, ශූන්‍යතාවය කියන්නේ. මේ කියපු අර්ථ නිරූපණය සමහර විට මේ අයට නො තේරෙන්නට පුළුවන්. උපමාවක් කියන්නම්.

අපි දන්නවා මිරිඟුව කියන එක. ඇත වතුර පිරිල තියෙනව වගේ පේනව. ඔය අව්ව පායල තියෙන විට, තාර පාරවල් වල - කෙළින් තියෙනවා නම් - ඈත පේනවා වතුර පිරිල තියෙනවා වාගේ. නමුත් එහෙම පෙනුණට, ළඟට ගියාට පස්සෙ එහෙම වතුර කියල දෙයක් නැහැ.

දැන්, අහසේ වලාකුළු නැත්නම්, නිල් පාටට හොඳට දිස් වෙනව. නමුත් අහසේ එහෙම නිල් පාටට දෙයක්, එතැනට ගියාට පස්සේ දකින්නට නැහැ. නමුත් අපට පේනවා, එහෙම නිල් පාට වාගෙ එකක්, තියෙනවයි කියල. එහෙම පෙනුනට, එහෙම දෙයක් සත්‍ය වශයෙන් නෑ. ඒ නිසයි හිස් කියල කියන්නේ.

ඒක නිසාම මේ ලෝකයේ සෑම දෙයක්ම, මේ ආකාරයෙන්, කලින් තිබෙනවා වගේ පෙන්නුම් කරනවා. නමුත් ප්‍රඥා ඇසකින්, හරියට ඒ දේවල් දෙස බලන විට, ඒ තුළ කිසිවක් විද්‍යමාන වන්නේ නැහැ. ඔක්කෝම හිස් වූ ධර්ම. ඒක නිසාම, ආනන්ද හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේගෙන් විමසනවා, මෙහෙම ප්‍රශ්ණයක්. "**සුඤ්ඤො ලෝකො, සුඤ්ඤො ලොකෝති භන්තේ වුච්චති. කිත්තාවතා නු ඛො භන්තේ, සුඤ්ඤො ලෝකෝති වුච්චති.**"

"බුදුරජාණන් වහන්ස, ලෝකය ශූන්‍යයි, ලෝකය ශූන්‍යයි කියල ඔබ වහන්සේ වදාරණව. කෙතෙකින් නම් මේ ලෝකය ශූන්‍යයි කියල කියනවද ?"

මෙයින් එහාට කියන කොටස තමයි, අවධානය යොමු කළ යුතු කොටස. නිවනට අවශ්‍ය ධර්ම කරුණුයි, මෙයින් දක්වෙන්නේ.

බුදුරජාණන් වහන්සේ ආනන්ද හාමුදුරුවන්ට පිළිතුරු වශයෙන් දක්වනවා **"යස්මාච බෝ ආනන්ද, සුඤ්ඤං අත්තේනවා, අත්තනියෙනවා තස්මා සුඤ්ඤෝ ලෝකෝති වුච්චති"** එහි අදහස මේකයි.

මේ ලෝකයේ ආත්මයක් හෝ ආත්මයට අයත් දෙයක් වශයෙන් ගන්නට යමක් නැති නිසයි ආනන්ද, මම "ශූන්‍යයි ශූන්‍යයි" කියල කියන්නේ. **"යස්මාච බෝ ආනන්ද, සුඤ්ඤං අත්තේනවා අත්තනියේනවා"** ආත්මයක් වශයෙන් ගන්නටත් නැහැ, ආත්මයට අයත් දෙයක් කියල ගන්නටත් කිසිවක් නැහැ. **තස්මා** ඒක නිසා **"සුඤ්ඤෝ ලෝකෝති වුච්චති,"** ලෝකය ශූන්‍යයි කියා ප්‍රකාශ කරනවා.

ඊළඟට අසනවා, බුදු රජාණන් වහන්සේ ප්‍රශ්නයක්. **"කිඤ්චානන්ද, සුඤ්ඤං අත්තේනවා, අත්තනියේනවා ?"** "මොනවද ආනන්ද, මේ ආත්මයක් වශයෙන් හෝ ආත්මයට අයත් දෙයක් වශයෙන් ගන්නට නැත්තේ, මොනවද මේ ආකාරයෙන් ශූන්‍ය වශයෙන් දර්ශනය වන්නේ, නැත්නම් ශූන්‍ය වශයෙන් අවබෝධ කරගත යුතු වන්නේ ? ඒකටම බුදුරජාණන් වහන්සේ මෙසේ පිළිතුරු දෙනවා.

1. **චක්ඛුං බො ආනන්ද සුඤ්ඤං අත්තේනවා, අත්තනියේනවා,**
2. **රූපා සුඤ්ඤා අත්තේනවා, අත්තනියේනවා,**
3. **චක්ඛු විඤ්ඤාණං සුඤ්ඤං අත්තේනවා, අත්තනියෙනවා,**
4. **චක්ඛු සම්ඵස්සෝ සුඤ්ඤෝ අත්තේනවා, අත්තනියේනවා,**
5. **යම්පිදං චක්ඛු සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වේදයිතං සුඛං වා දුක්ඛං වා අදුක්ඛමසුඛං වා තම්පි සුඤ්ඤං අත්තේනවා අත්තනියෙනවා.**

මේ ආදී වශයෙන් ආයතන හයටම කීවා. ඇහැ සම්බන්ධව බුදුරජාණන් වහන්සේ වදාළ කරුණු ටික පමණයි අප ප්‍රකාශ කළේ. ඔය වගේම බුදු හාමුදුරුවෝ කන, නාසය, දිව, ශරීරය, මනස කියන ඒවාත් විස්තර කළා. මෙහිදී කී ප්‍රකාශයේ සරල අදහස අපි පළමුවෙන් හිතල බලමු.

(1) **"චක්ඛුං සුඤ්ඤං අත්තේනවා, අත්තනියේනවා"** තමන්ගේ ඇහැ ශූන්‍යයි, ආත්මයකුත් නොවෙයි, තමන්ට (ආත්මයට) අයත් ධර්මයකුත් නොවෙයි. ඒ නිසා ඇහැ ශූන්‍යයි.

(2) ඊළඟට කියනවා **"රූපා සුඤ්ඤා අත්තේනවා, අත්තනියේනවා"** ඇහැට පෙනෙන රූප තියෙනවා, පණ ඇති හෝ පණ නැති සෑම වර්තමාන වශයෙන් තිබෙන රූපයක්ම දර්ශනය වනවා, තමන්ගේ රූප ස්කන්ධයත් තමාගේ ඇහැට පේනවා. මේ සෑම එකක්ම **"සුඤ්ඤා අත්තේනවා, අත්තනියේනවා"** ආත්මයක් හෝ ආත්මයට අයත් දෙයක් නොවන නිසා, මේවා ශූන්‍යයි.

(3) ඊළඟට බුදු හාමුදුරුවෝ කියන්නේ **"චක්ඛු විඤ්ඤාණං සුඤ්ඤං අත්තේනවා, අත්තනියේනවා"** ඇහැට රූපයක් ගැටුනාට පසුව, ඒ රූපය දැකීම පිළිබඳව දැනීමක් ඇතිවෙනවා. ඒ දැනීමක් ඇති වීමට කියන්නේ **චක්ඛු විඥානය** කියල. ඒ චක්ඛු විඥානයත්, **"සුඤ්ඤං අත්තේනවා, අත්තනියේනවා"** ආත්මයක් හෝ ආත්මයට අයත් නොවන නිසා ශූන්‍යයි.

(4) **"චක්ඛු සම්ඵස්සෝ සුඤ්ඤෝ අත්තේනවා, අත්තනියේනවා"** ඊළඟ කාරණාව. ඇහැට රූපයක් පෙනුනාම, ඒ රූපය නිසා දැනීමක් ඇති වෙනවා, ඒ දැනීම තමයි **චක්ඛු විඥානය**. මෙහිදී ඊට පසුව ඇතිවනවා **චක්ඛු සම්ඵස්සය**. මේ චක්ඛු සම්ඵස්සයත් ආත්මයක්වත්, ආත්මයට අයත් දෙයක්වත් නොවෙයි. චක්ඛු සම්ඵස්සය ගැන, විස්තර වශයෙන් වෙනත් සූත්‍රවල දක්වා තිබෙනවා. **චක්ඛුඤ්ච පටිච්ච රූපේච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං තිණ්ණං සංගති චක්ඛු සම්ඵස්සෝ** ඇහැයි රූපයයි ගැටීම නිසා, චක්ඛු විඥානය ඇති වනවා. මේ තිදෙනාගේ එකතුවට ප්‍රකාශ කරනවා **චක්ඛු සම්ඵස්සය** කියල. මෙතන චක්ඛු සම්ඵස්සය කියන එකත් ආත්මයක් හෝ ආත්මයට (තමාට) අයත් දෙයක් නොවෙයි. ඒ නිසයි, ඒක ශූන්‍යයි කියන්නේ.

(5) ඊළඟට කියනවා, **යම්පිදං චක්ඛු සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වේදයිතං සුඛං වා, දුක්ඛං වා, අදුක්ඛම සුඛං වා** ඇහැට රූපය පෙනිල, චක්ඛු විඥානය ඇතිවෙලා, ඒ තුළින් චක්ඛු සම්ඵස්සය ඇති වෙලා, ඵස්සය නිසා වේදනාවක් ඇතිවෙනවා. මේ අය අහල ඇති "ඵස්ස පච්චයා වේදනා" කියන කථාව. ඒ ඇහැට රූපය පෙනිලා, චක්ඛු සම්ඵස්සය ඇතිවෙලා, ඇතිවන වේදනාව සුඛ වේදනාවක් වන්නට පුළුවන්, දුක්ඛ වේදනාවක් වන්නට පුළුවන්, නැතිනම් "අදුක්ඛම සුඛ" මැදහත් වේදනාවක්-උපේක්ෂා වේදනාවක් වන්නට පුළුවන්.

"තම්පි සුඤ්ඤං අත්තේනවා, අත්තනියේනවා" ඒ සියළුම වේදනාවලත්, ආත්මයක් වශයෙන් ගන්නට දෙයක් නැහැ. ඒවා ආත්මයට අයත් දෙයකුත් නොවෙයි. ඒ නිසා ඒ සියළුම දේවලුත් ශූන්‍යයි ආනන්ද.

මේ විධියට ඇහැ ගැන කරුණු ටිකක් කීවා. නිවනට සිත පත්කර ගන්නට නම්, මේවා ශූන්‍ය වන්නේ කෙසේද කියන කාරණාව තමාගේ හදවත තුළින් දකින්නට ඕනෑ, හදවත තුළින් පෙනෙන්නට ඕනෑ, මේවා තමාගේ නොවෙයි, තමාට අයත් ධර්මයක් නොවෙයි, අනාත්මයි, ශූන්‍යයි කියල.

## ඇස ශූන්‍යයි

ඇහැ ගත්තොත් මේ ඇහැට "මගේ ඇහැ, මගේ ඇහැ" කියල මේ අය සිතාගෙන සිටිනවා නම්, මේ අය දැන් සිතින් අහල බලන්න ප්‍රශ්නයක් "මගේ ඇහැ, මගේ ඇහැ" කියල කියන්නේ, මගේ සිතද එහෙම නැත්නම් මගේ ඇහැද කියල. ඇහැට කවදාවත් සිතන්නට පුළුවන් කමක් නැහැ. "මගේ ඇහැ, මගේ ඇහැ" කියන එක, තමාගේ සිත තුළ තිබෙන සංඥාවක්, හඳුනා ගැනීමක් පමණයි. ඒක හොඳට අවබෝධ කර ගන්න. එතකොට "මගේ ඇහැ, මගේ ඇහැ" කියල යම්කිසි කෙනෙක් සිතනවා නම්, ඒක තමාගේ සිත තුළ තිබෙන හුදු දැනීම් මාත්‍රයක්, සංඥා මාත්‍රයක් පමණයි.

මේ ඇහැ කෙරෙහි තමාගේ සිත තුළ තණ්හාවක් ඇතිවෙලා තියෙනවා නම්, ඒ කියන්නේ "මේ ඇහැ හොඳයි, ලස්සනයි" ආදී වශයෙන් තමන්ගේ හෝ අනුන්ගේ ඇහැක් ගැන තණ්හාවක්, ආශාවක් ඇතිවනවා නම්, ඒක තියෙන්නේ ඇහේද එහෙම නැත්නම් තමාගේ සිත තුළද කියල දැන් සිතින් බලන්නට ඕනෑ. එහෙම බලනකොට තේරෙන්නට ඕනෑ තමන්ටම, මේ ඇහැ කෙරෙහි යම්කිසි තණ්හාවක් තියෙනවා නම්, ඒ තණ්හාව ජනිත වන්නේ, බාහිර රූපයේ නෙමෙයි තමාගේ සිත තුළයි කියලා.

ඇහැ කෙරෙහි යම්කිසි මානයක් තමාගේ සිත තුළ තිබෙනවා නම්, ඒ කියන්නේ, "මගේ ඇස් දෙක හොඳයි, මගේ ඇස්දෙක නිල් පාටයි, පෙනීම බොහොම හොඳයි" ආදී වශයෙන් විවිධාකාරයෙන් මාන ඇති වන්නට පුළුවන්, මේ විවිධාකාර මානයන් යම්කිසි කෙනෙකුගේ සිත තුළ ජනිත වනවා නම්, ඒ සියල්ල පහළ වන්නේ, තමාගේ සිත තුළ විනා, ඒ බාහිර රූප කොටස තුළ නොවෙයි. මේක හොඳට හදවත තුළින් දකින්නට ඕනෑ.

ඒ වගේම ඇහැ කෙරෙහි දිට්ඨියක් ඇති වනවා නම් - "දිට්ඨිය" කියන්නේ, යම් ආකාරයක වැරදි කල්පනාවක් - මේක "මගේ ඇහැ, මේක මගේ ආත්මය, මේක මට අයත් ධර්මයක්" ආදී කවරාකාරයෙන් හෝ දෘෂ්ඨිගත සංකල්පනාවක් පහළ වනවා නම්, මේ සෑම එකක්ම තමාගේ සිත තුළ තිබෙන හුදු සංඥා පමණයි, සිතිවිලි පමණයි, එකක්වත් ඇහැ තුළ තිබෙන දේවල් නොවෙයි. ඒක හොඳට තේරුම් ගතයුතු කාරණයක්.

ඊළඟට මේ ඇහැ අරගෙන අපි කියනවා, "ඇහැ, ඇහැ" කියල. ඒ කියන්නේ, අපි සම්මත වශයෙන් අනුමත කරගෙන තියෙනවා, "අපි මේකට ඇස කියමු" කියල. ඒ නිසා එදා ඉඳලා අපි මේකට ඇස කියන වචනය පාවිච්චි කරනවා. එතකොට මේ "ඇස" කියන සංඥාව තමාගේ සිත තුළ තිබෙන දෙයක් විනා, ඇහැ තුළ ඇති දෙයක් නොවෙයි. මේක හොඳට තේරුම් ගන්න. ඇහැ කියන එක පැත්තක තිබෙන රූප කොටසක්. ඒ රූපය හඳුනා ගැනීම සඳහා අපි සිතින් දානවා සංඥාවක්, හඳුනා ගැනීමක්. ඒකට "ඇහැ" කියා අපි ඉස්සර ඉඳලා කථා කළා. ඒක සම්මුති වශයෙන් පිහිටපු සත්‍යයක්. ඒ සම්මුති සත්‍යයේ පිහිටලා, අපි මේකට ඇහැ කියල කථා කරනව. මේ ඇහැ කියන සංඥාව, සිත තුළ තිබෙන දෙයක් විනා ඇහේ තියෙන ධර්මයක් නොවෙයි.

මේ ඇහැ කියන සංඥාව අපි අයින් කළොත්, එතකොට මොකක්ද මේ ඇහැ තුළ තියෙන්නේ කියල දූන් බැලුවොත්, මොකක්ද අපට පේන්නේ ? එතකොට අපට පෙනෙන්නට ඕනැ, ඇහැ පඨවි ධාතු ගොඩක්, ආපෝ ධාතු ගොඩක්, තේජෝ ධාතු ගොඩක්, වායෝ ධාතු ගොඩක් කියල. පඨවි කියන්නේ, පස් වන ගතිය. ආපෝ කියන්නේ, වතුර තෙතමනය ආදී ගතිය. තේජෝ කියන්නේ, උෂ්ණ- සීතල ගතිය. වායෝ කියන්නේ, පිම්බිච්ච හැකිලිච්ච ගතිය. මේ ලෝකයේ අජීවී සජීවී සෑම රූප ධර්මයක්ම සෑදී තිබෙන්නේ, මේ මූල ධාතු හතරෙන්. එතකොට ඇහැ තුළ ඔය මූල ධාතු හතර සහ ඒ මූල ධාතු හතර නිසා ඇතිවූ උපාදාය රූපයක් තිබෙනව. ඒ උපාදාය රූපයට තමයි, **චක්ඛු ප්‍රසාද රූපය** කියන්නේ. ඇහේ කළු ඉංගිරියාව හරියේ, බාහිර රූප දිස්වන කන්නාඩියක ඔප මට්ටමක් වාගෙ, ඒක ඇතුළෙ පිළිබිඹුව දිස්වන ආකාරයෙන් ඔප මට්ටමක් තියෙනව. ඒක තමයි ප්‍රසාද රූපය. ඒක පඨවි, ආපෝ, තේජෝ, වායෝ කියන ධාතු හතරෙන්ම හැදිච්ච ගතියක්.

ඇහැ කියන්නේ එතකොට, පඨවි ධාතුවක්, ආපෝ ධාතුවක්. තේජෝ ධාතුවක්, වායෝ ධාතුවක්, ඒ වගේම, ඒ ධාතූන් නිසා හටගත් උපාදාය රූපයක් කියන

හැඟීමක් තමාගේ සිත තුළ දැන් ඇතිවන්නට ඕනෑ. හරියට ධර්මාවබෝධයක් තිබෙන කෙනෙකුට, ඒ අවබෝධය ඇති වුනා නම්, ඒ හැඟීම, ඒ අවබෝධය තියෙන්නේ ඇඟ තුළ නොවෙයි, තමාගේ සිත තුළ කියා පෙනෙනවා.

එතකොට පඨවි ධාතුවට "පඨවි ධාතුව" කියල හඳුනා ගැනීම සඳහා, අපි සම්මත කරගෙන ඉස්සර ඉඳලා කථා කරනවා. ආපෝ ධාතු, තේජෝ ධාතු, වායෝ ධාතුවලටත්, අපි එහෙම කථා කරනවා. මේ පඨවි ධාතුව, "පඨවි ධාතුව" කියල හඳුනා ගන්නේ, ආපෝ ධාතුව "ආපෝ ධාතුව" කියල හඳුනා ගන්නේ, ඒ වගේම තේජෝ ධාතු සහ වායෝ ධාතු හඳුනා ගන්නෙත්, අපගේ සිත තුළ තිබෙන සංඥාවකින් විනා, රූපයේ තිබෙන දෙයක් නොවෙයි ඒ හඳුනා ගැනීම. ඒක තේරුම් ගන්න.

එතකොට "ඇඟ" කියන එක දැන් බැලුවාම, මොකක් කියලද තේරුම් ගත යුතු වන්නේ ? ඉස්සෙල්ලා ඇඟක් වශයෙන් දිස්වුනා. ඒක "මම" ය කියලා ගත්තා. "මගේ" කියලා ගත්තා. තණ්හාවෙන් දෘෂ්ටිවලින්, මානයෙන් නොයෙක් ආකාරයෙන් උපාදානය කළා. නැත්නම් මේ ඇඟ කියන කථාව වැරදි දෙයක්, මේක පඨවි, ආපෝ, තේජෝ, වායෝ ධාතු කියල ගත්තා. දැන් අපි ඒ තත්වයත් ඉක්මවා ගියා. පඨවි, ආපෝ, තේජෝ, වායෝ ධාතු කියන ඒවාත්, සිත තුළ තිබෙන සිතිවිලි ධර්මයක්. මේ සිතිවිලි වල ස්වරූපය කුමක්ද ? වහා ඇතිවුනා. ඇතිවූ ගමන්ම, සුළු වේලාවක්-ක්ෂණයක් පැවතුනා, ඊට පසුව නැතිවුනා. ඇතිවී ඇතිවී, නැතිවී නැතිවී යන ධර්මයක්. සිතේ ස්වරූපය ඒකයි. කයේ ස්වරූපයක්, වහ වහා බිඳී බිඳී යන එකක්. අපි මෙතන සිතට ප්‍රධාන අවධානය යොමු කරල කථා කරන්නේ. අපි මේ ඇඟ ගැන යම්තාක් සිතිවිලි ඇතිකර ගත්තානම්, ඒ සෑම සිතිවිල්ලක්ම තමාගේ සිත තුළ තිබෙන දෙයක් විනා, එය "ඇඟ" කියන රූප කොටස තුළ විද්‍යාමාන වන එකක් නොවෙයි.

ඇඟ පිළිබඳව පහළ වන සෑම සිතිවිලි ධර්මයක්ම, මේ මොහොතේ ඇතිවුණා, මේ මොහොතේ නැතිවුණා, ඊළඟ මොහොතේ තව සිතිවිලි පරම්පරාවක් ඇති වුණා. ඊළඟ මොහොත වන විට ඒවා නැති වුණා. මේ විධියට ඇතිවී ඇතිවී, නැතිවී නැතිවී යන චිත්ත ප්‍රවාහයක්, සිතිවිලි දාමයක් මෙතන තියෙන්නේ. මේ චිත්ත ප්‍රවාහය දෙස අපි සිතින්, ප්‍රඥාවෙන් බැලුවොත්, ඇතිවී ඇතිවී, නැතිවී නැතිවී යන මේ සිතිවිලි ධාරාව තුළ, සත්වයෙක් කියල, ආත්මයක් කියල, ගන්නට කිසිවක් ඉතිරි වන්නේ නැහැ. මොකද ? ඒ සියළුම සිතිවිලි ඇතිවී නිරුද්ධවී යන නිසා. දැන් අපේ සිතේ පහළ වන සිතිවිලි "මම"

ය," මගේ" ය කියල සිතුවත්, ඒ සිතිවිලි නැතිවුණාට පස්සෙ "මම" කියල,"මගේ" කියල ගන්නට කිසිවක් ඉතිරි වන්නේ නැහැ. මේ අනුව බැලුවාම, කලින් සම්පූර්ණයෙන් ඇහැක් ලෙස දිස්වුනාට, එය සම්පූර්ණයෙන් හිස් වූ ධර්මයක්. මේක හදවත තුළින් හරියට දකින කොට, ඇහැ තිබුණු තැන, තනිකර ආකාස ධාතුවක් වාගේ හිස් කුහරයක් වාගේ, සිතට පේන්නේ. ඇස් දෙකම ගලවල දාල තියෙන හිස් කුහරයක් වාගේ මේක හරියට අවබෝධ කළොත් පේන්නේ. හිස් භාවයක් දකින්නේ. මේ හිස් භාවය වැටහෙන්නේ සිතටයි. ඒ සිතේ හිස් ස්වභාවයයි, මෙතන "ඇහැ ශූන්‍යයි" කියා පවසන විට, අප කිවයුතු වන්නේ.

"ඇහැ" කියන එක රූප ධර්මයක් කියා හා කළින් කීවා. රූප ධර්ම සත්‍ය වශයෙන්ම රූප ධර්ම නොවෙයි, මේවා නාම ධර්ම කියන එකයි, දැන් අවබෝධ කරගත යුතු වන්නේ ඇහැ ශූන්‍ය වශයෙන් දකින්නට නම්. මේ ඇහැ රූප ධර්මයක් වශයෙන් පේනව. ඒක නැහැ කියන කථාව නෙවෙයි, මෙයින් අදහස් කරන්නේ. මේ ඇහැ පිළිබඳව සිතිවිලි මාත්‍රයක් ඇති වුනේ නැත්නම්, "ඇහැ" කියන එක අපගේ සිත තුළ දර්ශනය වන, සිත තුළ ඇති රූප කොටසක් නොවෙයි.

දැන් උදාහරණයක් කියන්නම්. මේ අයගේ දිව ගැන දැන් සිතුවොත් එහෙම, "දිව" කියල දෙයක් තිබෙන බව තේරෙනව, සිතට වැටහෙනව. එහෙම හිතන්න ඉස්සෙල්ලා, "දිව" කියල දෙයක් තිබුණාද කියලාවත් මේ අය දන්නවාද ? දිව, දිවේ පාඩුවේ පැත්තක ඔහෙ තියෙනව. අපි ඒක ගැන අවධානය යොමු කරල, අපගේ මනසිකාර ඒ පැත්තට යොමු වුණාම, ඒ පිළිබඳ සිතිවිලි මාත්‍රයක් ඇති වුණාම ඒ පිළිබඳ මනෝ ස්පර්ශයක් පහළ වුණාම පමණයි, දිව කියන එක තියෙනවා කියල අපට තේරෙන්නේ. දිව කියල රූප කොටසක් තිබෙන බව අපට වැටහෙන්නේ, අපේ සිත තුළින් ඒ නාම ධර්මයක් පහළ වුණොත් විතරයි. එහෙම නැත්නම් ඒ රූප ධර්මය අපේ සිත තුළ තිබෙන දෙයක් නොවෙයි. මේක ලෝකයේ ඕනෑම රූප ධර්මයකට අදාළ දෙයක්. මේ අයගේ නිවෙස ගැන දැන් සිහිපත් කළොත් විතරක්, මනසට නිවස අරමුණක් වෙයි. නැත්නම් ඒ නිවස නිවසේ පාඩුවේ පැත්තක තියෙයි. තමන් දන්නෙත් නෑ, ඒක තියෙනවාද නැද්ද කියල. මේ වගේ තමයි, ලෝකයේ තිබෙන ඕනෑම දෙයක් ගත්තත්. එතකොට "ඇහැ" කියන එක තනිකරම තමාගේ සිත තුළ පහළ වී යන, නාම ධර්මයක ප්‍රතිඵලයක් වශයෙන් දක්නා රූප කොටසක් විනා, ඒ නාම ධර්මය තමාගේ සිත තුළ ඇතිවුනේ නැත්නම්, ඔය ඇස කියන රූපය දර්ශනය නොවන හිස්වූ දෙයක්.

මේක තරමක් දුරට මේ අයට තේරුම් ගන්නට අපහසුද දන්නේ නෑ. තවත් සරල කරනව නම් දැන් අපි උදාහරණයක් හැටියට, මේ අය දැකපු දෙයක් ගනිමු. රුවන්මැලි චෛතයය කියල හිතමු. දැන් මේ වේලාවේ රුවන්මැලි චෛත්‍යය මතක් කළාම, මේ අයගේ සිතට රුවන්මැලි චෛතයය දර්ශනය වෙනව. පෙනෙනවා. නමුත් මේක අප අරමුණු කලේ නැත්නම්, සිතිවිල්ලක් සිතුවෙ නැත්නම්, රුවන්මැලි චෛත්‍යය තිබෙන බව අපි දන්නෙත් නෑ. ඒ චෛත්‍යය ඒක පාඩුවේ ඔහෙ පැත්තක තියෙයි. අපි ඒ ගැන සිතිවිලි සිතුවෙ නැත්නම්, ඒක අපට රූපයක් නොවෙයි.

මේකම තමයි අපේ ඇහැටත් කියන්නට තියෙන්නේ. අපේ ඇහැ අරගෙන මේ මගේ ඇහැ, මේ මම, මේක මගේ ආත්මය, මේක මට අයත් දෙයක්, මේක හොඳයි, මෙක ලස්සනයි ආදී විවිධාකාර සිතිවිලි ජනිත වීමක් හැර, මෙතන වෙන දෙයක් නැහැ. මේ සිතිවිලි ධර්ම ජනිත වුනේ නැත්නම්, ඇහේ ඇති වැදගත් භාවයකුත් නැහැ. ලෝකයේ ඇති ඕනෑම රූප කොටසකට මෙය අදාළයි. එතකොට ඇහැ කියන්නේ හුදු නාම ධර්මයක්, තමාගේ සිත තුළ ඇතිවී නැතිවී යාම. ඒ නාම ධර්මවල ස්වභාවය මොකක් ද ? ඇතිවෙච්ච ගමන්ම නැතිවී යෑම; වේගයෙන් ඇතිවී ඇතිවී, නැතිවී නැතිවී යන එක; අනිත්‍යයට යන එක. මේ විධියට ඇහැ සම්බන්ධ සිතිවිලි ධර්ම වහ වහා බිඳී බිඳී, බිඳී බිඳී ගියා නම්, එතකොට ඒ බිඳී ගිය නාම දෙස ආපසු බැලුවාම, මොනවද ඉතිරි වෙලා තියෙන්නේ ?

මා කලින් කීවා මේ අයට දිව ගැන සිහිපත් කරන්න, එතකොට සිහිපත් වෙයි කියලා. ඒ වෙලාවේ ඒක සිහිපත් වුණා. මේ වන විට ඒ ඇතිවුණු සිතිවිලි දෙස බැලුවොත් එහෙම, දැන් මොනවද ඉතිරි වෙලා තියෙන්නේ ? ඔක්කොම නිවිල ගිහිල්ලා, නිරුද්ධ වෙලා ගිහිල්ලා. එතකොට එතන ගන්නට කිසි දෙයක් නැහැ. සම්පූර්ණයෙන් හිස්. ඒකයි ශූන්‍යයි කියන්නෙ. චක්ඛුං සුඤ්ඤං අත්තේනවා අත්තනියෙනවා.

## රූප ශූන්‍යයයි

රූපා සුඤ්ඤා අත්තේනවා අත්තනියේනවා. ඇහැට පෙනන රූප ශූන්‍යයි. ආත්මයක් හෝ ආත්මයකට අයත් දෙයක් නොවෙයි. ඇහැට පෙනන රූප ගත්තාම, මගේ දුව, මගේ පුතා. මගේ ගෙදර, මගේ කාර් එක, මගේ ඇඟ - මේ විධියට විවිධාකාරයෙන්, විවිධ දෘෂ්ටි කෝණ වලින් මැන ගෙන, ඒවා හොඳයි, නරකයි, දුෂ්ටයි ආදී

විවිධාකාරයෙන් අපි ඒවා අරගෙන ග්‍රහණය කරනවා. මෙතැන අපි කියන්නේ සාමාන්‍ය පෘථග්ජන ලෝකයා. මේ විධියට කථා කරන කොට, ඇඟට පෙනන රූප නැඟ කියලා කෙනෙකුට කියන්නට බැහැ. නමුත් බුදු රජාණන් වහන්සේ කියන්නේ, "රූපා සුඤ්ඤා අත්තේනවා, අත්තනියේනවා." - රූප ශූන්‍යයයි, ආත්මයත් හෝ ආත්මයට අයත් දෙයක් නොවෙයි කියලයි. තමන්ගේ ඇඟ දිහා බලා, මේක මගේ ඇඟ, මගේ ඇඟ කියපු එක තමාගේ සිත තුළ තිබුණු සිතිවිල්ලක් කියල මා කලින් කීවානේ. මෙන්න මේ වගේම තමයි, බාහිර සජීවී වේවා, අජීවි වේවා කවර වස්තුවක් හෝ රූප ධර්මයක් අරගෙන, ඒවා කෙරෙහි මමායනය කිරීමක් (මමායනය කියන්නේ, මම කියල, මගේ කියල හිතාගෙන ඒක අල්ලා ගන්න එකට කියන තනි වචනයක්) කරනවා නම් ඒක තියෙන්නේ තමාගේ සිත තුළ විනා, අර බාහිරව තිබෙන සජීවී, අජීවී රූප ධර්මවල නොවෙයි. බාහිර තියෙන රූප ධර්ම අපි හිතින් අල්ලා ගත්තේ නැතිනම් මම ය කියා හෝ මගේ කියල, ඒ බාහිර රූප වල "මම", "මගේ" බවක් තිබෙන්නට බැහැ. ඒක සිත තුළ තිබෙන හැඟීමක් පමණයි.

අනික් අතින් මේ බාහිර රූප ධර්ම කියන්නේ, මා අර කලින් කී උදාහරණයෙන්ම තේරෙන්නට ඕනෑ, (අප රුවන්මැලි චෛත්‍යය ගැන කථා කළා) තමාගේ සිත තුළ පහළ වන සිතිවිලි ධර්මයක් විතරයි කියල. ඇඟ පිළිබඳව කියපු කථාවම මෙයට අදාළයි. බාහිර ලෝකයේ කොයි රූපයක් අරගෙන හරි, යම්කිසි සිතිවිල්ලක් ඇතිකර ගත්තේ නැත්නම්, ඒ බාහිර ලෝකයේ තිබෙන කිසිම රූපයක් තමාට කිසිම වැදගත් භාවයක් ලබාදෙන්නේ නැහැ. ඒක උසස්ය, ඒක පහත්ය, වටිනවාය කියා මොනම ආකාරයකින් හෝ නිර්ණය කරන්නටත් බැහැ, තමන්ගේ සිත තුළ කිසිම සිතිවිලි ධර්මයක් ඒ පිළිබඳව ඇතිවෙන්නෙ නැත්නම්. ඒ රූප ඔහේ බාහිර ලෝකයේ පැත්තක පවතියි.

මෙහිදී මා මේ අයට කියන්නම්, මාලුඞ්කපුත්ත සූත්‍රයේදී බුදුරජාණන් වහන්සේ දේශනා කළ දෙයක්. මාලුඞ්කපුත්ත හාමුදුරුවෝ බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටිනවා, "බුදුරජාණන් වහන්ස මට කෙටියෙන් බණක් කියන්න නිවන් යන්න" කියලා. එහිදී බුදුරජාණන් වහන්සේ මෙහෙම ප්‍රශ්නයක් ඇසුවා. "ඔබේ ඇසට පෙනෙන රූප තිබෙනවා, දැන් පවතින වර්තමාන රූප. දැන් ඇහැට වර්තමාන රූපයක් පෙනෙන්නේ නැත්නම් මාලුඞ්කපුත්ත, ඒ වර්තමාන පෙනෙන්නේ නැති රූප කෙරෙහි ඔබට ඡන්දයක්වත්, රාගයක්වත්, වෙනත් සිතිවිල්ලක්වත් ඇතිවන්නට පුළුවන්ද ?"

එතකොට උත්තර දෙනවා "ඒක වන්නට බැහැ" කියලා.

හොඳයි ඔබ අතීතයේදී දැකපු රූප තිබෙනවා. දැන්, අතීතයේ කවදාවත් දැකපු නැති රූපයක් නම්, ඒ අතීතයේ දැකපු නැති රූපය අරගෙන ඔබට ඡන්දයක්වත්, රාගයක්වත්. වෙනත් සිතිවිල්ලක්වත් ඇතිවන්නට පුළුවන්ද ?

ඒත් බැහැ.

ඔබ අනාගතයේ මෙහෙම රූපයක් දකින්නට යනවා කියන හැඟීමකුත් ඔබට නැත්නම්, එවැනි රූපයක් කෙරෙහි කිසිම සිතිවිල්ලක් ඇතිවන්නට පුළුවන්ද ?

එහෙමත් බැහැ.

ඊළඟට ඔබට අහන්න ලැබෙනවා මෙහෙම රූපයක් තිබෙනවා කියල කාගෙන් හරි. මෙහෙම රූපයක් තියෙනව ලස්සනයි, හොඳ දෙයක්, හරිම දර්ශනීයයි, ආදී විවිධාකාරයෙන් රූපය ගැන වර්ණනාත්මකව හරි, නැත්නම් විවේචනාත්මකව හරි, යම්කිසි කෙනෙක් රූපය ගැන කියනවා. එහෙම රූපයක් පිළිබඳව ඔබ ඇසුවෙත් නැත්නම්, ඒ නො අසන ලද රූපය පිළිබඳව ඔබට එන්න පුළුවන්ද සිතිවිලි මාත්‍රයක්, ඡන්දයක්, රාගයක්, කැමැත්තක්, ගැටීමක් වැනි, ඔය මොනව හරි සිතිවිල්ලක් ?

එන්න බැහැ.

එන්නට බැහැ තමයි සත්‍ය වශයෙන් ම. මොකද හේතුව ? තමන්ට මනසට අරමුණු වුනේ නැත්නම් මේ කිසිම රූපයක්, ඒ කිසිම රූපයක් කෙරෙහි කිසිම ආකාරයකින් ඡන්දයක්, කැමැත්තක් ඇති වන්නට බැහැ. රාගයක්, තණ්හාවක්, ඇලීමක්, බැඳීමක්, ඇති වන්නට බැහැ. මානයක් හෝ වෙනත් විවිධාකාර ක්ලේශ ධර්මයක් ඇතිවන්නටත් බැහැ. මම, මගේ කියන හැඟීමක්, කවර ආකාරයකින්වත් ඇතිවන්නට බැහැ. මෙය ඉතා ගැඹුරු කාරණාවක්. මේ අය පසුව හෝ මේ ගැන ගැඹුරෙන් කල්පනා කරල බලන්න. එතකොට තමාට තේරෙයි, **මේ බාහිර ලෝකයේ තිබෙන සෑම රූපයක්ම අපි කවර ආකාරයෙන් හෝ නිර්ණය කරලා, ඇගයීමකට පත් කරලා, වර්ණනාත්මකව හෝ විවේචනාත්මකව හෝ කොයි ආකාරයකින් හෝ මනසේ ඒ මනෝ පවිචාර ඇති කරගෙන කටයුතු කළත්, මේවා තමාගේ සිත තුළ පහළ වන හුදු සිතිවිලි**

**ධර්ම පමණක් විනා අන් කිසිවක් නොවෙයි කියල.** එතකොට බාහිර රූප කියන ඒවා ඔක්කොම, තමාගේ සිත තුළ පහළ වන නාම ධර්ම පමණයි.

ඇහැ කියන එකත් තමාගේ සිත තුළ තිබෙන නාම ධර්මයක්. බාහිර ලෝකයේ තිබෙන රූප කියන ඒවාත්, තමාගේ සිත තුළ තිබෙන නාම ධර්ම. නාම ධර්ම කියන්නේ සිතිවිලි. එතකොට ඒ සිතිවිලි ටිකක් තමාගේ සිත තුළ ඇතිවෙලා, නැතිවෙලා, යන එක හැර, ඔතන වෙන දෙයක් නැහැ. මේ රහස, මේකෙ තිබෙන යථාර්ථය. මේකෙ තිබෙන ගැඹුරු අර්ථය තේරුම් ගත්තා නම් එහෙම, අපි කිසිම රූපයක් උපාදානය කරන්නේ නැහැ. **උපාදාන කරනවා කියන්නේ තමාගේ සිත, සිතින්ම අල්ලාගෙන දඟලන එකට.** උපාදාන කරන්නේ එය නොදන්නාකම, අවිජ්ජාව තිබෙන නිසයි. ඒ නිසා බුදුරජාණන් වහන්සේ මෙහෙම ගාථාවක් දේශනා කරනවා.

**යස්ස පාරං අපාරං වා - පාරා පාරං න විජ්ජති**
**විතද්දරං විසං යුත්තං - තමහං බෲමි බ්‍රාහ්මණං**

ධම්ම පදයේ බ්‍රාහ්මණ වර්ගයේ තියෙන ගාථාවක්.

"යස්ස පාරං අපාරං වා - පාරා පාරං න විජ්ජති" - යමෙකුට අධ්‍යාත්මික ආයතනත් නැත්නම්, ඒ කියන්නේ ඇස, කන, නාසය, දිව, ශරීරය, මනස යන මේවා විද්‍යමාන වන්නේ නැත්නම්, "අපාරං" කියන්නේ රූප, ශබ්ද, ගන්ධ, රස, පොට්ඨබ්බ, ධර්ම - ඇහැට රූප, කනට ශබ්ද, නාසයට ගඳ සුවඳ, දිවට රස, කයට ස්පර්ශ, මනසට විවිධ දේ (මේවාට කියන්නේ අරමුණු කියලා) මේ අරමුණුත් විද්‍යමාන වන්නේ නැත්නම්, ඇහැත් නෑ, රූපත් නෑ, කනත් නෑ, ශබ්දත් නෑ, නාසයත් නෑ, ගඳ සුවඳත් නෑ ආදී වශයෙන් මේ විධියට ඒවා නැතිනම්, "විසං යුත්තං" බැඳීම් වලින් ඇත් වූ. "විතද්දරං" සිතේ තිබෙන පරිලාහයත් දැවීම්, තැවීම්, දරදඬු භාවයත්, නැති ඔහුට, "තමහං බෲමි බ්‍රාහ්මණං." සියලුම කෙලෙස් නැති කළ රහත් වූ කෙනෙක් කියා මා කියනවා කියන එකයි එහි අදහස. එයින් කියන්නේ, බාහිර ආරම්මණයි, අධ්‍යාත්මික ආයතනයි මොකක්වත් නැති එක දැකීම. වෙනත් වචන වලින් කියනවා නම්, මෙහිදී අදහස් කරන්නේ, මේ "ඔක්කොම ශූන්‍යයි කියල දකිනව" කියන එකයි.

මා මේ එක් ඉන්ද්‍රියක් අරගෙනයි කීවේ. ඇහැ මේ ආකාරයෙන් අරගෙන බලන විට සත්‍ය වශයෙන්ම විද්‍යමාන නොවන ශූන්‍ය ධර්මයක්. ඇහැට

පෙනෙන රූප, සත්‍ය වශයෙන්ම විද්‍යමාන නොවන ශූන්‍ය ධර්මයක්. මේ ඇසට පෙනෙන රූප බැලීමේදී සිදුවන ක්‍රියාවලිය මොකක්ද ? තමාගේ සිත තුළ නාම ධර්ම ටිකක්, සිතිවිලි ටිකක් ඇතිවෙලා, නැතිවෙලා යන එක පමණයි. ඔච්චරයි. ඒ නාම ධර්ම තමා ඇතිකර ගත්තේ නැත්නම්, ඔය බාහිර රූපවල කිසිම වටිනාකමක් නැහැ. මේ අනුව බලන විට ලෝකයේ තිබෙන රූප අගයනවා කියන්නේ තමාගේ සිත තුළ නාම ධර්ම ඇතිවී නැතිවී යාම පමණයි.

අපි තව උදාහරණයක් කියමු. මේවා තේරුම් ගැනීමට මේ අයට අපහසු විය හැකි නිසයි, මේ කියන්නේ. ලස්සන රූපයක් තියෙනවා. ජීවී රූපයක් කියා සිතමු. එතකොට මෙයාට ඉතාම හිතවත් හොඳ යාළුවෙක් එතන ඉන්නවා. ඒ වාගේම ඒ ඇහැට පෙනෙන රූපය කෙරෙහි තද වෛරයක් බද්ධ වෛරයෙන් කටයුතු කරන, ඔහු පෙන්නන්නට බැරි පුද්ගලයෙකුත් එතැන ඉන්නවා. මේ මොකක්වත් නැති මැදහත් පුද්ගලයෙකුත් එතැන ඉන්නවා. මේ තුන් දෙනාම එකවර ඒ රූපය දකිනවා. ඒ දැක්කාට පස්සේ මොකක්ද සිදුවන්නේ ? ඒ රූපය ප්‍රිය කරන පුද්ගලයාට, ඒ රූපය දැක්කාම සතුටක් ගෙන දෙනවා. ඒ රූපය අප්‍රිය කරන, ඒ රූපය පෙන්නන්නට බැරි පුද්ගලයාට, ඒක දැක්කට පස්සේ ඇතිවන්නේ මොකක්ද ? දුක්ඛ වේදනාවක්. මේ දෙකම නැති මැදහත් පුද්ගලායාට ඒ දෙකම නැහැ. මැදහත් වේදනාවක්. ඒ අනුව ඇතිවන සිතුවිලිත් එකිනෙකාට වෙනස් වනවා.

අපි කනට ඇසෙන ශබ්දයක් ගනිමු. තමන් ඉතා ප්‍රිය කරන ගායකුගේ හෝ ගායිකාවකගේ සින්දුවක් කියා හිතමු. ඒ ගායකයාගේ හෝ ගායිකාවගේ සින්දු ඉතාම අප්‍රිය කරන කෙනෙකුන් ඉන්නවා. මැදහත් සිතින් ඉන්න කෙනෙකුත් ඉන්න පුළුවන්. ඒ එකම සින්දුව තිදෙනාම එක වර අහන විට තුන් දෙනාගේම සිත් ක්‍රියාත්මක වන්නේ, තුන් ආකාරයට. එකම විධියට නොවෙයි.

එතකොට ඒකෙන් තේරුම් ගන්නට ඕනෑ කුමක්ද? බාහිර අරමුණුවල නොවෙයි, මේ වැදගත් භාවය තියෙන්නේ. ඇහැට පෙනෙන බාහිර රූපයේ ලස්සන, කැත ආදී මේ ඔක්කොම තිබෙන්නේ ඒ බාහිර රූපය තුළ නොවෙයි, තමන්ගේ සිත තුළ. කනට ඇසෙන ශබ්දය හොඳයි, ලස්සනයි, මිහිරියි, නරකයි ආදී වශයෙන් ඒවා ඔක්කොම තිබෙන්නේ තමන්ගේ සිත තුළ මිස, බාහිර ශබ්ද තුළ නොවෙයි. ඒක නිසා මේක හරියටම තේරුම්ගත්තාට පසුව - බාහිර අරමුණුවල තිබෙන වැදගත් භාවය කියන්නේ තමන්ගේ සිත තුළ නාම ධර්ම ටිකක් ඇතිවී

නැතිවී යෑම හැර වෙන දෙයක් නොවෙයි කියන අවබෝධ ඇති කර ගත්තාට පසුව - සිත උපේක්ෂිතව නිසලව තබා ගන්නට පුළුවන්. කිසිම ඇලීමක්, ගැටීමක් නැතුව, මැදහත් සිතින් ඉන්නට පුළුවන් වනවා. පුදුම සැහැල්ලුවක් සිතට ලැබෙනවා. මේ ධර්මය සාන්දිට්ඨික වශයෙන් මේ ජීවිතයේදීම අත්දකින්නට පුළුවන්. "මේ ධර්මය තියෙන්නේ, ප්‍රඥාවන්තයින්ට මිස මෝඩයිනට නොවෙයි" කියල බුදු හාමුදුරුවො දේශනා කර තිබෙනව. ඒ නිසා ප්‍රඥාව තිබෙන මට්ටමට අනුව ඒ ධර්මයන් ඒ ආකාරයෙන් අවබෝධ කරගෙන, ඒ සාන්දිට්ඨික ගුණයන් මේ ජීවිතයේදීම අත් දකින්නට පුළුවන්.

## චක්ඛු විඤ්ඤාණය ශූන්‍යයයි

දැන් අපි කරුණු දෙකක් කීවා. ඇහැ ශූන්‍යයි, ඇහැට පෙනෙන රූප ශූන්‍යයි. **චක්ඛු විඤ්ඤාණං සුඤ්ඤං අත්තේනවා, අත්තනියේනවා** ඊට පසු කියන තුන්වන කාරණාව. ඇහැට රූපය දැක්කාට පස්සෙ, චක්ඛු විඥානයක් ඇති වනවා. රූපය දැකීම පිළිබඳව සිතක් පහළ වනවා. මේක ඇසේ නොවෙයි පහළ වන්නෙ. තමාගේ සිත තුළ ජනිත වන සිතිවිලි නාම ධර්මයක්. ඇහැ නිශ්‍රය කරගෙන, ඇහැ ඇසුරු කරගෙන පහළවන නිසා එයට චක්ඛු විඥානය කියල කියනව. මෙය ශූන්‍යයි ; ආත්මයක් නොවෙයි. "මම බැලුවා", "මගේ දර්ශනය", "මම තමයි බලන්නේ" මේ විධියට වැරදි දෘෂ්ටිවල පිහිටල තමයි, සාමාන්‍ය ලෝක සත්වයා කටයුතු කරන්නේ. මෙන්න මේක අයින් කරගන්න තමයි, මෙතන චක්ඛු විඥානය ශූන්‍යයි, ආත්මයක් නොවෙයි, ආත්මයට අයත් දෙයක් නොවෙයි කියන්නේ.

කොහොමද චක්ඛු විඥානය ඇති වන්නේ ? හේතු ඵල ක්‍රියා දාමයක් නිසා. ඇහැ තියෙන්නට ඕනෑ. ඇහැ හොඳට පෙනෙන තත්ත්වයේ තියෙන්නට ඕනැ. රූපයක් තියෙන්නට ඕනෑ. ආලෝකය තියෙන්නට ඕනෑ. ඝන කළුවර වාගේ බෑ. ඒ විතරක් මදි. ඇහැ සම්බන්ධ ස්නායු තියෙනවා. ඒ ස්නායුන්ගේ ක්‍රියාකාරිත්වය නිසි පරිදි තියෙන්නට ඕනෑ. ඇහැ කොච්චර හොඳට තිබුනත්, ඇහේ බබා කියන කොටස හොඳට පැහැදිලි ව තිබුණත්, ඇහැ සම්බන්ධ දෘෂ්ටි ස්නායු කැපිල හෝ විනාශ වුනොත් ඇහැ පේන්නේ නැහැ. ඒ විතරක් මදි. මනසේ ක්‍රියා දාමයත් නිසි පරිදි තියෙන්නට ඕනෑ. අප තද කල්පනාවකට ගිහිල්ලා, තද නින්දකට ගිහිල්ලා, වෙන ගැඹුරු කල්නාවකින් ඈත බලාගෙන ඉන්න කොට, ළඟින් ගිය කෙනාත් පේන්නෙ නෑ. එහෙම වෙන්නටත් බැහැ. හිතේ ක්‍රියාකාරිත්වය තියෙන්නට ඕනෑ. මොලේ ශෛලයන්ගේ ක්‍රියා දාමයන් නිසි පරිදි සිදුවන්නට

ඕනෑ. මේ ඔක්කොම ක්‍රියා දාමයන්ගේ, හේතූන්ගේ එකතුව එකට ආවාට පස්සේ, ඇහැට රූපය පෙනුණාට පස්සේ, රූපය පිළිබඳ දැනීමක් ඇති වනවා. මේක හේතූන් නිසා හටගත් ඵලයක් විනා, අපට ඕනෑ විධියට ඇති වූ ධර්මයකුත් නොවෙයි, අපට ඕනෑ විධියට ඇති කර ගන්නට පුළුවන් ධර්මයකුත් නොවෙයි. හේතූන් තියෙනකොට ඒ හේතූන් නිසා ඇති වුණා. ඒක නිසා මේ හේතූන් නිසා ඇතිවන ධර්ම, හේතූන් නැති වන විට නැතිවනවා නම්, එහිදී "මම" කියල ගන්නට, "මගේ ආත්මය" කියල ගන්නට කිසිවක් ඉතිරි වන්නේ නැහැ.

**"චක්ඛු විඤ්ඤාණස්ස උප්පාදෝපි වයෝපි පඤ්ඤායති, යස්ස ඛො පන උප්පාදෝපි වයෝපි පඤ්ඤායති, අත්තා මෙ උපපජ්ජතීච වෙතිචාති ඉච්චස්ස ඒවමාගතං හෝති. තස්මා තං න උපපජ්ජති චක්ඛු විඤ්ඤාණං අත්තාති යෝ වදෙය්‍ය. ඉති චක්ඛු විඤ්ඤාණං අනත්තා"**

චක්ඛු විඥානයේ ඉපදීමක් පෙනෙනවා. නැතිවීමක් පෙනෙනවා. යමක ඉපදීමක් හා නැතිවීමක් තිබෙනවා නම්, මගේ ආත්මය මේ ඉපදෙනවා නේද නැතිවෙනවා නේද කියලා එයට කියන්නට සිදුවෙනවා. ඒක නිසා චක්ඛු විඤ්ඤාණය ආත්මයක්ය කියල කියන්නට කිසිසේත්ම සුදුසු නැහැ කියලා බුදුරජාණන් වහන්සේ ඡඡක්ක සූත්‍රයේ දක්වලා තිබෙනවා.

"ඇහැට රූපයක් පෙනුනාට පස්සේ, පහළ වන චක්ඛු විඥානය ඇතිවුණා, පැවතුනා, නැතිවුණා. ඇතිවී පැවතී නැති වන ඒ චක්ඛු විඥානය "මම" ය, කියල හිතනවා නම් යම්කිසි කෙනෙක්, "මේක මගේ" ය කියල යම්කිසි කෙනෙක් වැරදි දෘෂ්ටියකින් හිතනවා නම්, ඒ චක්ඛු විඥානය නැතිවන විටම "මම" බව නැති වන්නට ඕනැ, "මගේ" බව නැති වන්නට ඕනෑ. ඒ නිසා චක්ඛු විඥානය ආත්මයක් කියල, ආත්මයට අයත් දෙයක් කියල ගන්න එක කිසිසේත්ම සුදුසු නෑ. එතකොට තේරුම් ගන්න, චක්ඛු විඥානය කියන්නේ අර හේතූන් නිසා හටගත් ඵල ධර්මයක්. තමාට අයත් ධර්මයක් නොවෙයි, තමාගේ ධර්මයක් නොවෙයි. තමාට ඕනෑ විධියට ඇතිකර ගන්ටත් බැහැ. තමාට ඕනෑ විධියට නැතිකර ගන්නටත් බැහැ.

එතකොට ඇහැ නිසා පහළ වන චක්ඛු විඥාන සිත, හුදු හේතුඵල ධර්මයක්. ආත්මයක් කියල ගන්නට දෙයක් නැහැ එහි. හේතූන් නිසා පහළ වූ ඵල ධර්මයක් නිසා, මේක අනාත්මයි. ඒ වගේම, ඇහැ නිසා පහළ වන චක්ඛු විඥාන සිතිවිලි, ඇති වෙච්ච ගමන්ම නැතිවෙලා යනවා. "මම" කියලා ගන්නට

"මගේ" කියලා ගන්නට, ආත්මයක් කියල ගන්නට කිසිවක් ඉතිරි වන්නේ නැහැ. මේ ජීවිතය පුරා අපි කොච්චර ඇහැට රූප දැකලා සිතිවිලි ඇතිකර ගන්නට ඇද්ද ? අද බැලුවොත් එහෙම ඒ සිතිවිලි දෙසට ආපසු හැරිල, මොනවද ඉතිරිවෙලා තියෙන්නේ ? කිසිවක්ම නැහැ. හරියට රෑ දැකපු සිහින වගෙයි. මොකක්වත් ඉතිරිවෙලා නෑ. මේ නිසා **"චක්ඛු විඤ්ඤාණං සුඤ්ඤං අත්තේනවා, අත්තනියේනවා.**

## චක්ඛු සම්ඵස්සය ශූන්‍යයයි.

**"චක්ඛු සම්ඵස්සෝ සුඤ්ඤෝ අත්තේනවා, අත්තනියේනවා"** ඊළඟ කාරණාව, චක්ඛු සම්ඵස්සය ශූන්‍යයි, ආත්මයක් හෝ ආත්මයට අයත් දෙයක් වශයෙන් ගන්නට නැති නිසා. කිසිවක් නෑ, ආත්මයක් වශයෙන් ගන්නට. ඒක නිසා ඒක ශූන්‍යයි. මොකක්ද චක්ඛු සම්ඵස්සය කියන්නේ, මේ අයට මා කලින් කීවා ඇහැ, රූපය සහ චක්ඛු විඥානය, මේ තිදෙනාගේ එකතුවට චක්ඛු සම්ඵස්සය කියල කියනවා කියා. එතකොට අපි ඇහැ ශූන්‍යයි කියල කීවා, රූප ශූන්‍යයි කියල කීවා, චක්ඛු විඥානය ශූන්‍යයි කියල කීවා. මේ තුන් දෙනාගේ එකතුවට චක්ඛු සම්ඵස්සය කියල කියනවා නම්, ඒ චක්ඛු සම්ඵස්සය ශූන්‍ය නොවෙයි කියල අපට කියන්නට පුළුවන් ද ? චක්ඛු සම්ඵස්සය ඇතිවෙන්නට හේතු වූ කාරණා 3 ක් අප ප්‍රකාශ කළා. ඒ කාරණා තුනම ශූන්‍ය නම්, චක්ඛු සම්ඵස්සය කියන එකට පිහිටා සිටින්න තැනක් නැහැ. සම්පූර්ණයෙන්ම ශූන්‍ය වූ ධර්මයක්. හිස් වූ ධර්මයක්. චක්ඛු සම්ඵස්සය කියන්නේ, මනසින් ස්පර්ශ කිරීම. මේ මනසින් ස්පර්ශ කිරීම ගැන මා කළින් කීවා, මනසින් ඕනෑම රූපයක් ස්පර්ශ කළේ නැත්නම්, ඒ රූපයේ කිසිම අගයක් නැහැ කියලා. ඒ ස්පර්ශය ඇතිවෙච්ච ගමන් නැතිවෙලා ගියා, එච්චරයි. ඉතින් ඕකෙ ගන්නට කිසි දෙයක් ඉතිරි වන්නේ නැහැ නෙ. ඒක අවබෝධ කර ගන්න. ඒක හදවතින් දකින්න. මේ ඇහෙන් යම්තාක් ස්පර්ශ ඇති කර ගත්තා නම්, මනසින් ගිහිල්ලා ඒ දැකපු රූප ස්පර්ශ කළා නම්, ඒ ස්පර්ශ සෑම එකක්ම ඇති වුණා, පැවතුනා, නැතිවුණා. කිසි දෙයක් ඉතිරි වුනේ නැහැ. ඉතිරි වන්නේ නැහැ. අනාගතයේ එහෙමයි. දැනුත් එහෙමයි. අතීතයෙත් එහෙමයි. මේ ආකාරයෙන් දක්කාට පස්සේ, චක්ඛු සම්ඵස්සය ශූන්‍යයි කියල දකින්නට පුළුවන් වන්නට ඕනෑ.

## වේදනාව ශූන්‍යයයි

ඊළඟ කාරණාව, **යම්පිදං චක්ඛු සම්ඵස්ස පච්චයා උප්පජ්ජති වේදයිතං සුඛං**

වා, දුක්ඛං වා අදුක්ඛම සුඛං වා චක්ඛු සම්ඵස්සය නිසා යම් වේදනාවක් ඇති වෙනවා නම් - සුඛ හෝ දුක්ඛ හෝ මැදහත් වේදනාවක් - "තම්පි සුඤ්ඤං අත්තේනවා, අත්තනියේනවා", ඒකත් ශූන්‍යයි. ආත්මයක් හෝ ආත්මයට අයත් දෙයක් එහි නැති නිසා. එතකොට චක්ඛු සම්ඵස්සය නිසා ඇතිවන වේදනාව, බොහෝ දෙනෙක් කල්පනා කරනවා, මම වේදනා විඳිනවා, මගේ වේදනාව කියලා. මේවා ඔක්කොම වැරදි කල්පනා, වැරදි දෘෂ්ටි.

අපි ඇත්ත ඇති සැටියෙන් දකිනවා නම්, අපගේ සිත තුළ සම්මා දිට්ඨිය තියෙනවා; යහපත් දැකීම තියෙනව. මේ වේදනාව මගේ කියල ගන්නව නම්, මම වේදනාව විඳිනව කියල ගන්නව නම්, ඒක යහපත් දැකීමක් නොවෙයි. වැරදි දැකීමක්. මොකද ? ඇහැට රූපය ගැටුනට පස්සේ, චක්ඛු විඥානය ඇති වෙනව, චක්ඛු සම්ඵස්සය ඇති වෙනව. "ඵස්ස පච්චයා වේදනා" ඵස්සය නිසා වේදනාවක් ජනිත වුනා. ඒ වේදනාව ජනිත වන ආකාරය මේ අයට කිව්වා. එක එක්කෙනා බලන, එක එක දෘෂ්ටි කෝණයට අනුව එය ඇති වන්නේ. මා කලින් කීවා, ඇහැට පෙනෙන රූපයක්, උපමා වශයෙන් අරගෙන. එතකොට ඒ වේදනාව ඇතිවුනේ, තමගේ සිත තුළ ඒ දකින ලද රූපය, තීරණය කරන ලද සංඥා සහ සංස්කාර ධර්මයන්ගේ ප්‍රතිඵලයක් වශයෙන්. ඒ කියන්නේ, සිතෙන් සිතපු ආකාරයට අනුව ඒ වේදනාව පහළ වුණා. "හොඳයි හොඳයි" කියල හිතුවොත් සුඛ වේදනාවක්, "නරකයි නරකයි" කියල හිතුවොත් දුක්ඛ වේදනාවක්, මැදහත් සිතින් බැලුවොත් මැදහත් වේදනාවක් ඇති වන්නට පුළුවන්. මේ වේදනාව ඇතිවෙච්ච ගමන්ම පැවතුණා, නැතිවෙලා ගියා. ආත්මයක් කියල ගන්නට කිසි දෙයක් ශේෂ වන්නේ නැහැ.

මේ ජීවිතය පුරා කොයි තරම් දුක් වේදනා අපි වින්ඳාද ? සුළු ප්‍රමාණයක් සැප වේදනා වින්ඳා, මැදහත් වේදනාත් අනන්තවත් වින්ඳා. දැන් මේ මොහොතේ යම්කිසි සැප හෝ දුක් හෝ මැදහත් වේදනාවක් මේ අය අත් දකිනව. ඊයේ මේ මොහොත් අත් දැකපු  කිසිම වේදනාවක් මේ අයගේ සිත් තුළ දැන් නැහැ. ගිය අවුරුද්දේවත්, ගිය ආත්මයේවත් නොවෙයි, දැන් පැය භාගයකට උඩදී දැකපු වේදනාවක් නොවෙයි, මේ අය දැන් අත් දකින්නේ. විනාඩියකට උඩදී අත් දැකපු වේදනාවක් නොවෙයි අත් දකින්නේ. දැන් මොහොතකට උඩදී අත් දැකපු වේදනාවක් නොවෙයි අත් දකින්නේ. මේ වර්තමාන ක්ෂණයේ, මේ වර්තමාන මොහොතේ පවත්නා සුඛ හෝ දුක්ඛ හෝ මැදහත් වේදනාවක් තමයි, මේ වෙලාවේ අත් දකින්නේ. ඊළඟ ක්ෂණයේ අත් දකින්නේ, දැන්

තියෙන සුඛ දුක්ඛ හෝ මැදහත් වේදනා අතරින් එකක් නොවෙයි, අනාගතයේ පහළ වන වේදනාවක්. මේ ඇති වෙච්ච වේදනා, ඇති වෙච්ච ගමන්ම නැතිවී ගියා නම් මේවා තුළ කිසිම දෙයක්, ආත්මයක් වශයෙන් ගන්නට ඉතිරි වන්නේ නැහැ. හේතූන් නිසා හටගත් ඵල ධර්ම.

ඒක නිසා බුදු හාමුදුරුවො කියනව, **"සුඛාපි ඛෝ අග්ගිවෙස්සන, වේදනා අනිච්චා, සංඛතා, පටිච්ච සමුප්පන්නා, ඛය ධමමා, වය ධම්මා, විරාග ධම්මා, නිරෝධ ධම්මා"**, ආදී වශයෙන්. වේදනා තුනටම ඔය කථාව කියනකොට තමයි, සැරියුත් හාමුදුරුවො රහත් වුනේ. එතකොට සුඛ වේදනාවක් ගත්තත්, දුක් වේදනාවක් ගත්තත්, අදුක්ඛම සුඛ-මැදහත්-වේදනාවක් ගත්තත් "අනිච්චා" අනිත්‍යයට ගියා, නැතිවෙලා ගියා. ඊළඟට "පටිච්ච සමුපන්නා" හේතූන් නිසා හටගත්තා. තමන්ට ඕනෑ විධියට ඇතිකර ගත්තා නොවෙයි; ඇති වුණා නොවෙයි. තමන්ට හිතුණත් දුක් වේදනාවක් ඇතිකර නොගෙන ඉන්නට ඕනැයි කියල, එහෙම තමන් කොච්චර අකැමැති වුණත්, දුක්ඛ වේදනාවක් ගෙන දෙන කරුණු ආවට පස්සෙ, දුක්ඛ වේදනාව ඇති නොවී ඉන්නට පුළුවන් සමතෙක් නැහැ. වේදනා නිරෝධයකට සිත පත්කර ගන්නට, අනිමිත්ත චේතෝ සමාධියකට පත් කර ගන්නට, සංඥා වේදයිත නිරෝධයකට පත්කර ගන්නට පුළුවන් ශක්තිය තිබෙන කෙනෙකුට නම් පුළුවන්. එහෙම නැති කෙනෙකුට නම්, ඒ වේදනා ගෙනදෙන හේතු ආපු ගමන්ම, වේදනාව ඇතිවන එක වළක්වන්නට බැහැ. ඇතිවන එක ඇතිවනවාමයි. එතකොට සුඛ වේදනාවත් එහෙමයි. දුක්ඛ වේදනාවත් එහෙමයි, මැදහත් වේදනාවත් එහෙමයි. මේ එක එක වේදනාවක් "මම" කියල හිතනවා නම්, ඒ වේදනාව "මම" කියල හිතන එක සිතේ තිබෙන සංඥාවක් පමණයි, හැඟීමක් පමණයි. මේ වේදනාව "මම" විඳිනවා කියල හැඟීමක් තියෙනවා නම්, ඒකත් හිතේ තියෙන හැඟීමක් හැර, එය වේදනාව තුළ තිබෙන ධර්මයක් නොවෙයි. ඒ වේදනාව, "මගේ වේදනාව" කියල හිතනවා නම්, ඒකත් තමාගේ සිත තුළ තිබෙන හුදු දැනීම් මාත්‍රයක් පමණයි. මේ විධියට මේ ඇතිවන නාම ධර්ම නැතිවී යන නිසාම වේදනාව කියන එක ශූන්‍ය ධර්මයක්.

දැන් මේකට ටිකක් ගැඹුරු උපමාවක් මම කියන්නම්. **නන්දකෝවාද සූත්‍රයේ** තියෙන උපමාවක්. පහනක් දැක්වෙනවා. පොල්තෙල් දාලා, තිරේ දාලා, පහන පත්තු වෙනවා. එතකොට පහන දැල්වෙන්නට හේතු තුනක් මෙතන තියෙනවා. තෙල් ටික හැම මොහොතක් ගානේම අනිත්‍යයට යනවා. ඒක මේ අය දන්නවා. පහන් තිරයත් හැම මොහොතේම පිච්චි පිච්චි, අනිත්‍යයට යනවා. ඒකත් මේ

අය දන්නවා. පහන් දැල්ලත් නිරන්තරයෙන්ම ඇතිවී ඇතිවී, නැතිවී නැතිවී යනවා. ඒකත් මේ අය දන්නවා. එතකොට පහන් දැල්ලේ යම්කිසි ප්‍රභාස්වර ගතියක් තියෙනවා නම්, ඒකත් හැම මොහොතේම ඇතිවී ඇතිවී, නැතිවී නැති වී යනවා. එතකොට ආලෝකය ඇතිවී ඇතිවී, නැති වී නැතිවී යනව කියලද මේ අය හිතන්නේ, එහෙම නැත්නම්, ආලෝකය ස්ථිර ධර්මයක් කියලද හිතන්නේ. පහනේ තියෙන තෙලුත් අනිත්‍යයට යනවා නම්, තිරයත් අනිත්‍යයට යනවා නම්. පහන් දැල්ලත් අනිත්‍යයට යනවා නම්, පහන් දැල්ලේ ගින්දරේ තිබෙන ප්‍රභාස්වර භාවය, නැත්නම් වර්ණය යන දේවලුත් අනිත්‍යයට යනවා නම්, ආලෝකය අනිත්‍යයට යන්නේ නැහැ කියන්නට පුළුවන් ද ? බැහැ. ඒක ඒකාන්ත වශයෙන්ම අනිත්‍යයට යනවා. නමුත් ඒක හැම වේලාවේම පවතිනවා කියා පේනවා. ඒ පේන්නේ, හැම වේලාවේම නැතිවී නැතිවී යන ආලෝක ශක්තිය, වේගයෙන් ඇතිවී ඇතිවී, නැතිවී නැතිවී යන බව මනසට දකින්නට නොහැකි නිසයි. ඒක පුළුවන් නම් "ආලෝකය අනිත්‍යයි" කියා දකියි. ඒ වගේම ඇහැ අනිත්‍යයට යනවා. චක්ඛු විඥානය අනිත්‍යයට යනවා. ඒ වගේම චක්ඛු සම්ඵස්සයත් අනිත්‍යයට යනවා. ඔය තුන නිසා ඇතිවන චක්ඛු සම්ඵස්සජා වේදනාව නිත්‍යයයි කියල කෙනෙකුට ගන්නට පුළුවන්ද ? ආත්මයි කියල ගන්නට පුළුවන්ද ?

ඕකේ අනෙක් පැත්තත් තියෙනවා. අනිත්‍ය නිසාම ඇහැත් අනාත්මයි, මම නොවෙයි, මගේ ආත්මයත් නොවෙයි. රූපයත් මම හෝ මගේ ආත්මය නොවෙයි. චක්ඛු විඥානයත් මම හෝ මගේ ආත්මය නොවෙයි. එහෙම නම් මේවා නිසා පහළ වන චක්ඛු සම්ඵස්සයත් මම නොවෙයි, මගේ ආත්මය නොවෙයි. එතකොට මේවා නිසා පහළ වන චක්ඛු සම්ඵස්සජා වේදනාව මම හෝ මගේ ආත්මය කියල ගන්නට පුළුවන් ද ? අර පහනේ ආලෝකය අනිත්‍යයයි කියල තේරුම් ගත්තා වගේම මේකත් තේරුම් ගන්නට බලන්න. එහෙම බැලුවොත් තේරුම් ගත්තොත් තමන්ට තේරෙයි, සම්පූර්ණයෙන්ම මේවා ශූන්‍යයි කියන කථාව.

එතකොට මේ ඇහැ පිළිබඳව, කරුණු පහක් ගැන අපි කථා කළා. මේ හැම එකක්ම තමාගේ සිත තුළ පහළ වන නාම ධර්ම පමණයි කියන එකත් කීවා. ඇහැ කියන එක තමාගේ සිත තුළ තියෙන සිතිවිලි ධර්ම ටිකක් පමණයි. ඇහැ නැත කියන එක නොවෙයි මෙයින් අදහස් කරන්නේ. එතකොට රූප කියන ඒවා - රූප නැහැ කියන එක නොවෙයි මා මේ කථා කරන්නේ. රූප කියන ඒවා ඔක්කොම - ඇහැට පේන, තමන්ගේ රූප හරි, බාහිර රූප හරි ඕනෑ

එකක් නාම ධර්මයක් පමණයි. මේක ඉතා වැදගත් දෙයක්. හොඳින් අවබෝධ කරගත යුත්තක්. චක්ඛු විඥානය නාම ධර්මයක් පමණයි. චක්ඛු සම්ඵස්සය කියන එකත්, හුදු නාම ධර්මයක් හැර අනි කිසිවක් නොවෙයි. චක්ඛු සම්ඵස්සය නිසා ඇති වුණා නම් වේදනාවක්, ඒකත් විඳීම් මාත්‍රයක්, නාම ධර්මයක් හැර අන් කිසිවක් නොවෙයි. මේ ඔක්කොම එකට ගත්තොත් එහෙම - ඇහැ සම්බන්ධ මේ කොටස් ඔක්කොම නාම ධර්ම ටිකක් ඇති වනවා, පවතිනවා. නැතිවනවා. එතකොට ඇතිවෙලා, පැවතිලා, නැතිවෙලා යන ඒ ධර්මවල මොනවත් ආත්ම වශයෙන් හෝ ආත්මීය වශයෙන් (ආත්මීය වශයෙන් කියන්නේ, ආත්මයට අයත් දෙයක් වශයෙන්) ගන්නට නැති නිසා, සියල්ලම ශූන්‍යයි, හිස්. මේක හරියට දකිනවා නම්, සිතට අරමුණක එල්ලෙන්ට බැහැ. සිත හිස් වෙනව.

මෙන්න මේ අනුසාරයෙන් අනෙක් ඉන්ද්‍රියන් ගැනත් මේ අය සිතන්නට ඕනෑ. මේ එක එක ඉන්ද්‍රියක් විස්තර කරනවා නම් සෑහෙන දීර්ඝ විස්තරයක් කරන්නට වෙනවා.

කන, ශබ්දය, කන හා ශබ්දය නිසා පහළ වුණ සෝත විඤ්ඤාණය, ඒ නිසා පහළ වෙච්ච සෝත සම්ඵස්සය. ඒ සෝත සම්ඵස්සය නිසා ඇති වූ වේදනා- සැප, දුක්, මැදහත් වේදනා.

නාසය, ගඳ සුවඳ, ඒ නිසා පහළ වන ඝාන විඤ්ඤාණය, ඒක නිසා ඇතිවන ඝාන සම්ඵස්සය, ඒක නිසා පහළ වන වේදනා.

දිව, රස. ජිව්හා විඤ්ඤාණය, ඒක නිසා පහළ වන ස්පර්ශය, ඒ තුළින් ඇතිවන සුඛ, දුක්ඛ, මැදහත් වේදනා.

කය, කයට දැනෙන විවිධ ස්පර්ශ (පොට්ඨබ්බ ධර්ම), ඒක නිසා පහළවන කාය විඤ්ඤාණය, කාය විඥානය තුළින් ඇති වන කාය සම්ඵස්සය, ඒකෙන් පහළ වන කාය සම්ඵස්සජා වේදනා,

මනස, මනසට අරමුණු වන විවිධ දේවල්, මනෝ විඤ්ඤාණය, මනෝ ස්පර්ශ, ඒ නිසා පහළ වන මනසින් ඇතිකර ගන්න සියළුම වේදනා.

මේ ඔක්කොම එක එකක් වෙන් වෙන් වශයෙන් අරගෙන ශූන්‍ය වශයෙන් දැක,

එය තමාගේම අවබෝධයක් බවට පත්කර ගන්න. එසේ අවබෝධ කරගෙන, කරගෙන යනකොට පෙනෙයි, මේ ඔක්කොම (මේ ඉන්ද්‍රිය හයටමයි, මම කථා කරන්නේ) නාම ධර්ම ටිකක් ඇතිවෙලා, නැතිවීම හැර වෙනත් දෙයක් මෙතන නැහැනේ කියල.

ඇහැට පෙනෙන රූප සම්බන්ධයෙන් පහළ වූ සිතිවිලි ධර්ම ටිකක් තියෙනව. ඒ වගේම කනට, නාසයට, දිවට, කයට. මනසට. මේ සිතිවිලි ධර්ම ඇතිවී ඇතිවී නැතිවී නැතිවී යෑම හැර, මෙතන මොකක්ද මම කියල ගන්නට තියෙන්නේ ? මොකක්ද මගේ කියල ගන්නට තියෙන්නේ ? මොකක්ද මගේ ආත්මය කියල ගන්නට තියෙන්නේ ? මේ ඔක්කොම ඇතිවෙච්ච ගමන් නැතිවෙලා යනවා නෙ, මේ ඔක්කොම අනිත්‍යයි නෙ. මේ ඔක්කොම ඇතිවෙලා නැතිවී ගියාම මොකක්ද ආත්මයක් වශයෙන් ගන්නට ඉතිරි වන්නේ, කියලා අවබෝධ වන විට අනාත්ම දර්ශනය පෙනී ගියහොත් මුළු කයම එවිට නොපෙනී යනවා. සිත අරමුණකින් තොරව වාගේ, හිස්වී යනවා. මොකද ? විවිධ අරමුණුවල එල්ලී එල්ලී සිතිවිලි පැවතී ගියා. මේ විධියට යථාභූත ඥාන දර්ශණයක් තුළින් ඇත්ත ඇති සැටියෙන් දකින කොට, අර සිත එල්ලී එල්ලී පැවති ඒ ආරම්මණයන් කප කපා, කප කපා හැරියා. එසේ කපා හැරීමේ ප්‍රතිඵලයක් වශයෙන්, සිතට යන්නට තැනක් නෑ, එල්ලෙන්නට අරමුණක් නෑ. සිත නිසල විය යුතුයි. ඒකයි, එහිදී සිදුවන ක්‍රියාදාමය. මේ සිත නිසල වුනාම, ඇහැට රූපය පේන්නෙත් නෑ, සිතට රූපය වැටහෙන්නෙත් නෑ. බාහිර ලෝකයේ කිසිම රූපයක් තමාගේ මනසට අරමුණු වන්නේ නෑ. හුදු තනිකර ඝන කළුවර දැනීම් මාත්‍රයක් පමණක් පවතිනවා නම්, අන්න ඒවාගෙ දෙයක්. ශූන්‍ය දර්ශණයක්.

එතකොට ඒවාගේ තත්ත්වයකට සිත පත් වුනොත්, අපි ඒකට කියනව ශූන්‍යතාවය කියල. මේ ශූන්‍යතාවය, පහළ මට්ටමක තිබෙන, ඕලාරික තත්වයේ තිබෙන ශූන්‍යතාවයක්. ඒකෙ ගැඹුරු, ගැඹුරු, ගැඹුරු, ගැඹුරු මට්ටම් තියෙනවා. මේ ඉස්සෙල්ලාම අත්වන ශූන්‍යතාවයක් අප කථා කළේ. මේ ශූන්‍යතාවය යම්කිසි කෙනෙකුට අත් දකින්නට පුළුවන් නම්, මේ වෙලාවේදි "මම" කියල ගන්නට, නැත්නම් "මගේ ආත්මය" කියල ගන්නට, ඉතිරි වෙලා තියෙන්නේ, ඔන්න ඔය මොකක්වත් නැති හිස් භාවයයි. ඒක දැනෙන ස්වරූපය පමණයි.

මේකත් හැම වෙලාවෙම පවතින ධර්මයක් නොවෙයි. අනිත්‍යයට යනව, නැතිවෙලා යනව. මෙය තිබෙන කොට "මම" ය කියල, "මගේ ආත්මය" ය කියල අපි ගත්තත්,

මේක නැතිවෙලා ගියාට පස්සේ, මොකක්ද මම කියල, මගේ කියල ගන්නට ඉතිරි වන්නේ ? මෙතනත් මොකවත් නෑ නේ. මේ හිස් බවත් අනාත්මයි. ආත්ම නොවෙයි.

එතකොට ඒ ශූන්‍ය තත්ත්වයට පත්වුනාම ඒකත් ඒකාන්ත වශයෙන්ම සංස්කාර ධර්මයක්. ඒකත් අනිත්‍යයි, ඒකත් අනාත්මයි කියා අවබෝධ වුනාට පස්සේ, ඔයිට වඩා ගැඹුරු ශූන්‍යතාවයකට සිත පත් වනවා. ඒ ශූන්‍යතාවයත් අනිත්‍යයි, අනාත්මයි, කියා පෙනී යන විට නිවනට සිත පත්වෙනවා. මේ ආකාරයෙන් මේ ජීවිතයේදීම මේ අනුව සමාධිමත් සිතකින් විදර්ශනා ප්‍රඥාවකින් මේ කරුණු දකීම තුළින් කෙනෙකුට නිවන් අවබෝධ කර ගන්නට පුළුවන්. හැබැයි, ප්‍රඥාව, සමාධිය දියුණු කෙනෙකුට පමණයි. එහෙම නැතිව "මේවා අනිත්‍යයි, මම නොවෙයි, මගේ නොවෙයි, මගේ ආත්මය නොවෙයි" කියා කියමින් හෝ අසමින් පමණක් සිටිනා සමාධි ප්‍රඥා දියුණු නැති කෙනෙකුට නොවෙයි.

සාරාංශය

හොඳයි, මේ දක්වා කියූ කාරණාවල කෙටි සාරාංශය දැන් කියන්නම්. ඒ කෙටි සාරාංශය ඇසුවාට පස්සෙ මේ කියපු කාරණා විස්තර වශයෙන් මේ අයටම අවබෝධ කර ගන්නට පුළුවන් වෙයි.

අපි කථා කළේ ශූන්‍යතාවය හෙවත් හිස් භාවය පිළිබඳවයි. ශූන්‍යතාවයට බුදු හාමුදුරුවෝ කියන්නේ "සුඤ්ඤත" කියන වචනය. විවිධ තැන්වල ඒක බුදු හාමුදුරුවෝ දේශනා කර තිබෙන බව පළමුවෙන් කීවෙ.

ශූන්‍ය කියන්නේ, යම්කිසි දෙයක් ඉස්සෙල්ලා තිබෙනවා කියා පේනවා. නමුත් සත්‍ය වශයෙන්ම එහෙම දෙයක් නැහැ. තමන්ගේ ඇඟ ගත්තොත්, මේ ශරීරය කියල දෙයක් තියෙනවා කියා පේනවා. සත්‍ය වශයෙන් එහෙම දෙයක් නැහැ. භාවනාව දියුණු විට තමන්ගේ ඇඟ තමන්ගේ සිතට පෙනෙන්නේ නැහැ. සම්පූර්ණයෙන් හිස් දෙයක්. ශූන්‍ය දෙයක්. අනෙක් ධර්මත් ඒ වගේ.

භාවනාව හුඟක් දියුණු කෙනෙකුට, ඉස්සෙල්ලා මුළු ලෝකයම පෙනුනත් පසුව තමන්ගේ සිතට ලෝකයම පෙනෙන්නේ නැහැ. හිස් දෙයක්, කලින් තිබෙනවා වගේ තේරෙනවා. නමුත් ඇත්ත ඇති සැටියෙන් දැක්කාට පස්සේ ඒක නොතේරී සිත හිස් භාවයට යනවා. ඒ හිස් භාවයට යන්නේ, සිත ඒ

අරමුණු අල්ලාගෙන එල්ලෙන්නේ නැති නිසා. මෙන්න මේ හිස් භාවය ගැනයි අප පළමුවෙන් විස්තර කළේ. හිස් භාවය කුමක්ද කියන කාරණාවයි පෙන්නුම් කළේ.

ඒ "හිස්" කියන කාරණාව විස්තර කිරීමට බුදුරජාණන් වහන්සේ වදාළ සළායතන සංයුක්තයේ "**සුඤ්ඤලෝක**" සූත්‍රයේ එක් කොටසක් පමණක් ප්‍රකාශ කළා, ඇහැ හා සම්බන්ධව පමණක්. ඇහැ ශූන්‍යයි. ඇහැට පෙනෙන්නේ මොනවද ? රූප. රූප ශූන්‍යයි. ඇහැට රූප පෙනුනාම, ඒ පිළිබඳ දැනීමක් ඇති වනවා. චක්ඛු විඥාණය කියල ඒකට කියනව. චක්ඛු විඥානය ශූන්‍යයි. ශූන්‍යයි කියන්නේ, ආත්මයක් නොවෙයි, ආත්මයට අයත් දෙයකුත් නොවෙයි. ඊළඟට චක්ඛු සම්ඵස්සය ඇති වනවා. ඒකත් ශූන්‍යයි. එයින් වේදනාව ඇති වනවා. වේදනාවත් ශූන්‍යයි. මේ වේදනාව ගැන කියන කොට හුදු වේදනාව විතරක් නොවෙයි, වේදනාවක් ඇති වුනාට පස්සෙ, පහළ වනවා නම් යම්තාක් සිතිවිලි ධර්ම ලෝභයක් හරි, ද්වේශයන් හරි, ගැටීමක් හරි, ආශාවක් හරි, අනිත්‍යයි, දුකයි, අනාත්මයි කියලා හරි, ඒ ආදී කවර දෙයක් ගත්තත්, වෙදනාව ශූන්‍යයි කියන කථාවට ඒ සියල්ලම අන්තර්ගත වෙනවා. ඒ ඔක්කොම ශූන්‍යයි. මේ සෑම එකක්ම සිතිවිලි ධර්මයක් ඇතිවීම, නැතිවීම හැර වෙන කිසිවක් නොවෙයි.

මේවා කොයි ආකාරයෙන් අපි තණ්හාවෙන් ගත්තත්, මානයෙන් ගත්තත්, දිට්ඨියෙන් ගත්තත්, උපාදාන කළත්, මම කිව්වත්, මගේ කිව්වත්, මගේ ආත්මය කිව්වත්, මගේ පුතා, මගේ දුව, ආදී වශයෙන් කවර ආකාරයකින් ග්‍රහණය කළත්, මේ සෑම එකක්ම හුදු සිතිවිලි ධර්ම ටිකක් ඇතිවී, නැතිවී යෑම හැර, අන් කිසිවක් නොවෙයි කියන එකයි, අප පෙන්නුම් කළේ. මේ විධියට ඉන්ද්‍රිය හයටම මේක හරියටම දැක්කොත් එහෙම, තමන්ට තේරෙනවා, මේ සිතිවිලි ඇති වනවා, පවතිනවා, නැති වනවා, මෙතන ආත්ම කියල ගන්නට කිසි දෙයක් ඉතිරි වෙන්නේ නැහැ නේ කියලා. ඒ අවබෝධය ඇති වන විට, සම්පූර්ණයෙන්ම හිත හිස්වී යනවා. සිතට කිසිම අරමුණක් නැතුව සිත ශූන්‍යතාවයකට පත් වෙනව.

මේ ශූන්‍යතාවයත් අනිත්‍ය වූ ධර්මයක්, සංස්කාර ධර්මයක්, අනාත්ම වූ ධර්මයක් කියා අවබෝධ වුනාම ඊට වඩා ගැඹුරු ශූන්‍යතාවයකට පත් වනවා. ඒ ශූන්‍යතාවයත් අනිත්‍යයි, නිත්‍ය නොවෙයි, ඒකත් මම හෝ මගේ ධර්මයක් නොවෙයි, ආත්ම නොවෙයි, මේකත් අනාත්මයි, කියන අවබෝධය තමාගේ

සිත තුළින් ප්‍රත්‍යක්ෂ ලෙසම හරියට දැක්කොත් එම ශූන්‍යතාවයත් නිරුද්ධ වී නිවීගිය, නිවනට සිත පත් කර ගන්නට පුළුවන්.

මේ විධියට පිළිපැදීම තුළින් මේ අයට නිවන් අවබෝධ කර ගන්නට පුළුවන් වේවි, සමහර විට මේ ජීවිතයේදී. එහෙම නැත්නම් මේ කුශල ශක්තිය ඒකාන්ත වශයෙන්ම, කවදා හෝ දවසකදී නිවන් අවබෝධ කර ගැනීමට හේතු වාසනා වේවි. එසේම වේවා.